(හයවැනි පාර්ලිමේන්තුව —තෙවැනි සභාවාරය)

අංක. 18]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2008 අගෝස්තු මස 22 වැනි සිකුරාදා පූ. භා. 9.30 ට

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0075/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) 1994 වනවිට සමස්ත නැගෙනහිර පළාතත්, උතුරු පළාතේ කඳවුරුවලින් බහුතරයත් රජය සතුව පැවති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 1994 අගෝස්තු මස 25 වැනි දින වන විට රජයේ හමුදා පාලනය යටතේ පැවති සියලුම හමුදා කඳවුරු කවරේද;

(ii) 2001 දෙසැම්බර් මස 01 වැනි දින වන විට රජයේ පාලනය යටතේ පැවති කඳවුරු කවරේද;

(iii) 2005 නොවැම්බර් මස 17 වැනි දිනට රජයේ පාලනය යටතේ පැවති කඳවුරු කවරේද;

(iv) අද වන විට රජයේ පාලනය යටතේ පවතින කඳවුරු කවරේද;

(v) යම් කඳවුරක් යටත් කරගෙන තිබුණේ නම්, එසේ යටත් කරගත් දිනය සනාථ කිරීමට තිබෙන සාක්ෂි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0076/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) 2007 ඔක්තෝබර් මස 10 වැනි දින දිවයින පුවත්පතෙහි ප්‍රධාන සිරස්තලය වූයේ "සිංහල කොටියෙක් අත්අඩංගුවේ" යන්න බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම තැනැත්තා සම්බන්ධයෙන් වත්මන් තත්ත්වය කවරේද;

(ii) ඔහුට එරෙහිව චෝදනා ගොනු කරන්නේද;

(iii) චෝදනා ඉදිරිපත් කරනු නොලැබ අත් අඩංගුවේ සිටින තවත් "සිංහල කොටි" කොපමණ සිටිත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0077/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1994 අප්‍රේල් මස 25 වැනි දින සිට මේ දක්වා වූ කාලය තුළ,—

(i) ක්‍රියාත්මකව පැවති ඇඟලුම් සහ නිමි ඇඳුම් කම්හල් සංඛ්‍යාව සහ ඒවායෙහි සේවයේ යෙදී සිටි මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ක්‍රියාත්මකව පැවති පිඟන් භාණ්ඩ කම්හල් සංඛ්‍යාව හා ඒවායෙහි සේවයේ යෙදී සිටි මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) වැවිලි කර්මාන්ත අංශය තුළ තේ, රබර් හා පොල් සඳහා පැවති කම්හල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම කර්මාන්තවලට අයත් වතුයාය සංඛ්‍යාව හා කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව කොපමණද;

(v) ක්‍රියාත්මකව පැවති පාවහන් සමාගම් සංඛ්‍යාව හා ඒවායේ සේවය කළ කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව කොපමණද;

(vi) ධීවර කර්මාන්තය තුළ නියැලී සිටි පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(vii) කෘෂි කර්මාන්තය තුළ නියැලී සිටි පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(viii) පශු සම්පත් කර්මාන්තය තුළ නියැලී සිටි පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0330/'08

4.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මින්නේරිය මැතිවරණ කොට්ඨාසයට අයත් මහසෙන් ගමට නුදුරින් ඇති ගල්ලිඳ ගමට සමීප පොතාන නමැති ඉඩම මින්නේරිය වනෝද්‍යානයට පවරාගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ඉඩම සංවර්ධනය කිරීම සඳහා කිසියම් අයෙකුට පවරා දී තිබේද;

(ii) එසේ නම්, ඒ කවුරුන් වෙත කවර පදනමක් මතද;

(iii) මින්නේරිය අභයභූමිය තුළ, සංචාරක හෝටලයක් හෝ නිවාඩු නිකේතනයක් ඉදිකිරීම සඳහා කිසියම් අයෙකුට අවසර දී තිබේද;

(iv) එසේ නම්, ඒ කවුරුන් වෙත කවර පදනමක් මතද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0340/'08

5.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—ඛනිජතෙල් හා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කාර්මික සේවයේ යෙදී සිට විශ්‍රාම ගොස් සිටින මාකොළ දකුණ, ශාන්ති මාවත, 253/28 ලිපිනයෙහි පදිංචි එච්. බී. ගාමිණීදාස මහතා ඇතුළු 46 දෙනෙකුට 1994 සිට මේ දක්වා ගෙවීමට නියමිත වැටුප් වැඩිවීමේ දීමනාව ගෙවා නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) අදාළ දීමනාව මෙම අයට ගෙවීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0343/'08

6.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටේ සංවර්ධන කටයුතු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා 2007.08.07 වැනි දින නාවලපිටියේදී හා 2007.08.08 වැනි දින කුරුණෑගලදී පවත්වන ලද රැස්වීම් සඳහා වේදිකා ඉදිකිරීම් කටයුතු කළේ කවර ආයතනයක් මගින්ද;

(ii) මෙම වේදිකා සඳහා අදාළ ආයතන වලට ගෙවන ලද සම්පූර්ණ මුදල කොපමණද;

(iii) මෙම මුදල් ගෙවන ලද්දේ කවර ආයතනයක් මගින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0467/'08

7.

ගරු විජිත රණවීර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007.12.31 වැනි දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ නෙටොල්පිටිය ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මහ වාරි, සුළු වාරි, සහ වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2007.12.31 වැනි දිනට අදාළ බල ප්‍රදේශය තුළ සිටින කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඉඩම් හිමි ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) ඒ හැර වෙනත් ගොවීන් සිටීනම් එම ගොවීන් සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මියයාම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතර පැන නැඟී ඇති ගැටළු සංඛ්‍යාව කොපමණද;

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත අදාළ බල ප්‍රදේශය තුළින් වාර්තා වී ඇති අඳ ගොවි ගැටළු සංඛ්‍යාව කොපමණද;

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0468/'08

8.

ගරු විජිත රණවීර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007.12.31 වැනි දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මහ වාරි, සුළු වාරි, සහ වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2007.12.31 දිනට අදාළ බල ප්‍රදේශය තුළ සිටින කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඉඩම් හිමි ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) ඒ හැර වෙනත් ගොවීන් සිටීනම් එම ගොවීන් සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මියයාම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතර පැන නැඟී ඇති ගැටළු සංඛ්‍යාව කොපමණද;

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත අදාළ බල ප්‍රදේශය තුළින් වාර්තා වී ඇති අඳ ගොවි ගැටළු සංඛ්‍යාව කොපමණද;

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0469/'08

9.

ගරු විජිත රණවීර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007.12.31 වැනි දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ මෝදරවාන ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මහ වාරි, සුළු වාරි, සහ වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2007.12.31 වැනි දිනට අදාළ බල ප්‍රදේශය තුළ සිටින කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඉඩම් හිමි ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) ඒ හැර වෙනත් ගොවීන් සිටීනම් එම ගොවීන් සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මියයාම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතර පැන නැඟී ඇති ගැටළු සංඛ්‍යාව කොපමණද;

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත අදාළ බල ප්‍රදේශය තුළින් වාර්තා වී ඇති අඳ ගොවි ගැටළු සංඛ්‍යාව කොපමණද;

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0514/'08

10.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,—මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාතේ ලංකා බැංකු ශාඛාවල පැවති පරිඝණක ක්‍රියාකරු තනතුරු පුරප්පාඩු හතක් සඳහා පවත්වන ලද තරඟ විභාගයකින් පසු 2005.08.01 වැනි දින සිට එකී පත්වීම් ලබා දී ඇති බවත්;

(ii) එසේ පත්වීම් ලද සියලු දෙනා ජාතික ආධුනිකත්ව මණ්ඩලයේ පරිඝණක හා තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික ලබා ඇති අය බවත්;

(iii) මෙසේ පත්වීම් ලද අපේක්ෂකයින් රු. 300/- ක දෛනික දීමනාවක් මත සේවයේ යොදවන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වසර දෙකකට ආසන්න කාලයක් අඛණ්ඩව දෛනික පදනම මත සේවය කිරීමෙන් පසු, එම සේවය අත්හිටුවන බවට 2007.07.05 වැනි දින ඔවුනට ලිඛිතව දැනුම් දී තිබූ බවත්;

(ii) එහෙත් මේ දක්වා සේවය අත්හිටුවා නොමැති අතර, තවමත් දෛනික පදනම මත සේවය කරන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ලංකා බැංකුවට අඛණ්ඩව වසර තුනකට ආසන්න කාලයක් දෛනික පදනම මත සේවය කර ඇති මොවුන්ගේ සේවය ස්ථිර කිරීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0515/'08

11.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,—කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් 2007 වර්ෂයේ යල කන්නයේ දී මිලට ගත් වී කිලෝ එකක මිල, මිලදී ගත් ආයතන සහ ගබඩා කළ වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කන්නයේදී ම මහවැලි කලාප වලින් වී අලෙවි මණ්ඩලය විසින් මිල දී ගත් වී ප්‍රමාණය කොපමණද;

(iii) එම කන්නයේදීම වී අලෙවි මණ්ඩලය ගබඩා කළ වී ප්‍රමාණය, විකුණුම් මිල සහ මිල දී ගත් ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මිනිස් පරිභෝජනය සඳහා සහ සත්ව ආහාර සඳහා නිකුත් කළ වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) 2007 වර්ෂයේ දී වී වගාවෙන් ලැබූ අස්වැන්න යල සහ මහ කන්න වලදී වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2007 වර්ෂයේදී පිටරටින් ගෙන් වූ වී ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0516/'08

12.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,—පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව, මනම්පිටිය ප්‍රදේශයේ දී මහවැලි ගංගාවෙන් මහා පරිමාණයෙන් වැලි ගොඩදැමීම සිදුවන බවත්;

(ii) එමගින් විශාල පරිසර හානියක් සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මනම්පිටිය ප්‍රදේශයේ දී මහවැලි ගංගාවෙන් වැලි ගොඩ දැමීම සඳහා බලපත්‍ර ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම බලපත්‍රලාභීන්ගේ සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iii) අදාළ බලපත්‍ර නිකුත් කරන ලද්දේ භූ විද්‍යා සමීක්ෂණ හා කැණීම් කාර්යාංශයේ නිසි පරීක්ෂණයකින් පසුවද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) ඉහත ප්‍රදේශයේ අනවසර වැලි ගොඩදැමීම නතර කිරිම සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0543/'08

13.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,—තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) සුනාමි ව්‍යසනය හේතුවෙන් හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ නිවාස හා දේපල අහිමිව අසරණ වූ පවුල් දහසකට පමණ නිවාස ලබා දී ඇත්තේ කුලීගොඩ ගලගොඩ සහ රත්ගම - මොන්රෝවියා ගම්මාන දෙකෙහි බවත්;

(ii) වසර දෙකකට වැඩි කාලයක් මෙම පවුල් එම ගම්මාන දෙකෙහි ජීවත් වන අතර, ඡන්ද හිමි නාමලේඛණයට ද ඇතුළත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගම්මාන දෙකෙහි පදිංචි ජනතාවට තැපැලෙන් ලැබෙන ලිපි බෙදීම තැපැල් දෙපාර්තමේන්තුව මගින් සිදු නොකරන බවත්;

(ii) වගකිව යුතු නිලධාරීන්ට හා ගාල්ල ප්‍රාදේශීය තැපැල් අධිකාරී වෙත ලිඛිතව කරුණු ඉදිරිපත් කර ඇතත්, ඒ පිළිබඳව කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මෙම ජනපද දෙකෙහි පදිංචිකරුවන්ට තැපැලෙන් ලැබෙන ලිපි බෙදීමට සැලැස්වීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0544/’08

14.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,—ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත අනුව 2005.10.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් දිවයින පුරා විසිරී තිබූ පොකුරු බස් සමාගම් නීත්‍යානුකූලව ශ්‍රී ලංගම බවට පත් කර ඇති බවත්;

(ii) ඉහත ගැසට් පත්‍රයට අනුව එම පනතේ විධිවිධාන ක්‍රියාත්මක වන දිනය 2005.10.19 විය යුතු බවත්;

(iii) ඒ අනුව, පොකුරු බස් සමාගම්වල ක්‍රියාත්මක වූ වැටුප් ක්‍රමය ද 2005.10.19 වැනි දින සිට ශ්‍රී ලංගම වැටුප් ක්‍රමය බවට නිරායාසයෙන් පත් වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත වැටුප් ක්‍රමය 2008.01.01 වැනි දින සිට බලපවත්වන පරිදි ක්‍රියාත්මක විය යුතු බවට ශ්‍රී ලංගම සභාපති හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ අංක මු/ප/බ්‍රී/70 හා 2008.01.07 දිනැති 2008 අංක 2 දරන මුදල් කොට්ඨාස චක්‍රලේඛය මගින් දක්වා ඇති බවත්;

(ii) මෙය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත හා අංක 1415/15 දරන 2005.10.19 දිනැති (අති විශේෂ) ගැසට් පත්‍රයේ විධිවිධාන උල්ලංඝණය කිරීමක් හා අවතක්සේරු කිරීමක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එකී පොකුරු බස් සමාගම්වල සිටි සේවකයින් සඳහා අදාළ වැටුප් ක්‍රමය 2005.10.19 වැනි දින සිට ක්‍රියාත්මක කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0634/’08

15.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගාල්ල නාගොඩ රජයට පවරාගත් ඇජ්තොප් වත්ත ඉඩමෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුවට වෙන් කරන ලද කොටසේ ප්‍රවේශ මාර්ගය ද ඇතුල්වන ලෙස යාබද ඉඩම්කරු විසින් අනවසරයෙන් අත්පත් කරගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සවිස්තරව මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) උඩුගම බාර් හන්දියේ ආයුර්වේද බෙහෙත් ශාලාවට ඉඩම ලබාදුන් අය වෙත ඉහත වෙන් කරන ලද ඉඩම ලබාදීමට තීරණයක් ගෙන තිබේද;

(ii) ඒ කවර නෛතික තත්ත්වයක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) මෙලෙස ඉඩම් කොටසක් ලබාදීම තුළින් සිදුවන්නේ අනවසර භුක්තිකරුට එම ඉඩම අයත් වීමට තිබෙන ඉඩකඩ වැඩිවීම බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) මිනින්දෝරු දෙපාර්තමේන්තුවට වෙනත් ඉඩමක් ලබාදීම නිසා ඉහත ඉඩම නිරවුල් කර, ප්‍රාදේශීය ලේකම් වෙත පවරා ගන්නේ කවර කාල පරාසයක් තුළද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඊ) ආයුර්වේදයට ඉඩම පරිත්‍යාග කළ අයට එම වටිනාකමට සරිලන ඉඩමක් ලබාදීමට අවශ්‍ය නම්, ඉහත අනවසර භුක්තිකරුගේ ඉඩමට යාබදව නොවන, වෙනත් ස්ථානයකින් එය ලබාදීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(උ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (සංශෝධන),— 2003 අංක 27 දරන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 142,— වැඩසටහන 2,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දහ අටකට (රු. 18,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | | |
|---|---|---|---|---|---|
| ශීර්ෂය | 142 | — | සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | | |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන වැඩසටහන | | |
| ව්‍යාපෘතිය | 3 | — | සමාජ සංස්කෘතික ඒකාබද්ධව කටයුතු කිරීම | | |
| | | | පුනරාවර්තන වියදම් | රු. | 18,000,000 |
| | | | මුළු වියදම | රු. | 18,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ජූලි මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 4 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 3 දක්වා එකතුව රුපියල් 3,198,180,332.

*2.
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.
ඩීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.
සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.
අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*6.
ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.
ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.
ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*9.
බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*10.
අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*11.
සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*12.
ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*13.
ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.
ජාතික පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*16.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ නියෝගය (අංක 1),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 සහ 3 වැනි වගන්ති යටතේ ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 මාර්තු මස 28 දිනැති අංක 1543 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*17.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ නියෝගය (අංක 2),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 සහ 3 වැනි වගන්ති යටතේ ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 අප්‍රේල් මස 07 දිනැති අංක 1544/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.08.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*18.

ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග,— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ඕ) සහ (ක) ඡේද යටතේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2007 දෙසැම්බර් මස 17 දිනැති අංක 1528/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*19.

නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා,— නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 21 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජූනි මස 27 දිනැති අංක 1555/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*20.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියමය,— 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ වගන්තිය යටතේ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජනවාරි මස 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*21.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියෝග,— 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ සහ 23 ආ වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 32 වැනි වගන්තිය යටතේ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 පෙබරවාරි මස 01 දිනැති අංක 1534/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*22.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 දිනැති අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද "2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ( තේ කර්මාන්ත ශාලා ඉදි කිරිම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතු ය.

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*24.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*25.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධුරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධුරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා නැවත එම ධුරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධුරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*28.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමිකය හා දීමනාව, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*29.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*30.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනාව සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*31.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

32.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

33.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

[1]

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.